16

# සූරා අල් අලක්

පළමු වැකි පහ

ජාහිලියියා සමාජය අනාචාරයන් හි ගිලී පැවැතුණි. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ එය පිළිකුල් කළහ. මෙය වෙනස් විය යුතු ය, යන සිතුවිල්ල සහිත ව තනි ව කල්පනා කරමින් හිරා ගුහාවෙහි නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ කල් ගත කළේ ය. මේ අතර දිනක් ජිබ්රීල් අලයිහිස්සලාම් තුමාණෝ එක්වරම එහි පෙනී සිට "පාරායනය කරනු මැන!" යැයි පැවසූහ. එවිට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා මම පාරායනයට නොදත්තෙමි යි කීහ එවිට ජිබ්රීල් අලයිහිස්සලාම් තුමා නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා තදින් වැලඳගෙන "පාරායනය කරනු මැන!" යැයි පැවසී ය. එවර ද නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා තමා පාරායනය කරන්නට නොදන්නා බව පැවසී ය. මෙසේ තෙවරක් ම සිදු විය. ඉන් පසු ජිබ්රීල් අලයිහිස්සලාම් තුමාණෝ සූරා අලක් හි පළමු වැකි පහ පාරායනය කර පෙන්වූහ. වහීවල ආරම්භය මෙය වන්නේ ය.

اقْرَأْ بِاسْمِ رَبِّكَ الَّذِي خَلَقَ ﴿١﴾ خَلَقَ الْإِنسَانَ مِنْ عَلَقٍ ﴿٢﴾
اقْرَأْ وَرَبُّكَ الْأَكْرَمُ ﴿٣﴾ الَّذِي عَلَّمَ بِالْقَلَمِ ﴿٤﴾ عَلَّمَ الْإِنسَانَ
مَا لَمْ يَعْلَمْ ﴿٥﴾

1. ( නබිතුමනි ) ඔබගේ රබ්බුගේ ශුද්ධ වූ නාමයෙන් පාරායනය කරනු මැනවි. ඔහු (කුමන ආකාරයේ අයකු ද යත්) සියල්ල මැව්වේ ඔහු වන්නේ ය.

2. ලේකැටියකින් ඔහු මිනිසා මැව්වේ ය.

3. (තව ද ) පාරායනය කරන්න ඔබගේ රබ්බු ඉතා ම අභිමානවත් ය.

4. ඔහු කුමන ආකාරයේ අයකු ද යත් පන්හිඳ භාවිතයෙන් ලිවීමට ඔහු ඉගැන්වූයේ ය.

5. මිනිසාට ඔහු නොදත් (සියල්ල) ඉගැන්වූයේ ය.

| තේරුම | අරාබි පදය |
|---|---|
| පාරායනය කරනු මැන, කියවනු මැන, ඉගෙනගනු මැන, විමසා බලනු මැන | اِقْرَاْ |
| ඔබගේ දෙවියන්ගේ නාමයෙන් | بِاسْمِ رَبِّكَ |
| මිනිසා මැව්වේ ය. | خَلَقَ الْاِنْسَانَ |
| ලේ කැටියකින් | عَلَقٍ |
| ඔබගේ දෙවියා අභිමානවත් ය | وَرَبُّكَ الْاَكْرَمُ |
| පන්හිඳ මගින් ඉගැන්වූයේ ය. | عَلَّمَ بِالْقَلَمِ |
| මිනිසාට ඉගැන්වූයේ ය | عَلَّمَ الْاِنْسَانَ |
| නොදන්නා දේ | مَا لَمْ يَعْلَمْ |

අල් කුර්ආනයේ පළමු ව පහළ කරනු ලැබූ වැකියෙන් කියවෙන්නේ රබ්බුගේ නමින් පාරායනය කරන අයුරු ඉගෙන ගන්නා ලෙස අණ කරන්නේ ය. ලෝකයාට මගපෙන්වීම සඳහා අල්ලාහ් තෝරා ගත් දූතයා මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් අල්ලාහ් සමග සම්බන්ධ වන පළමු අවස්ථාවේ ම ඔහුගේ නමින් පාරායනය කරන ලෙස අණ කෙරන්නේ ය.

අල්ලාහ් "මැවුම්කරු ය" යන්න ප්‍රථමයෙන් පොදුවේ පවසා පසු ව මිනිසා මැවූ බව පවසන්නේ ය.

මවගේ ගර්භාෂයේ මිනිසා අලක් යන අවස්ථාවේ ඇලී පැවතියේ ය. පසු ව අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් එම අලක් ක්‍රමයෙන් වැඩි මිනිස් රුවක් ලැබුවේ ය. මෙය අල්ලාහ්ගේ ශක්තිය හා ඔහුගේ දයාව විදහා දක්වන්නේ ය. ඊ ළඟ වැකිය පන්හිඳ ගැන කතා කරන්නේ ය. මිනිස් ජීවිතයේ අධ්‍යාපනය

සඳහා මුල් වන්නා වූ දෙය වශයෙන් ද පුළුල් ව කතා කරනු ලබන්නා වූ දෙය වශයෙන් ද එය හැඳින්විය හැකි ය. එම නිසා පන්හිඳ භාවිතයෙන් ඉගැන්වීම ආරම්භ කළ අල්ලාහ් අභිමානවත් යැයි අල් කුර්ආනය පවසන්නේ ය.

අල්ලාහ් සියල්ල දත් අයෙකි. මිනිසා කිසිවක් නොදැන සිටියේ ය. මිනිසාට අවශ්‍ය සියල්ල උගන්වන්නේ ඔහු ය.

මිනිසා, මිනිස් ජීවිතය සහ විශ්වය යන සියල්ල දන්නේ අල්ලාහ් පමණි. මිනිසා සියල්ල ඉගෙන ගන්නේ ඔහුගෙන් ය, යන සත්‍යය මෙම වැකියෙන් ඉදිරිපත් වේ.

අධ්‍යාපනය, සදාචාරය යනාදියෙහි සැබෑ අගය ගැන නොදැන සිටි ජාහිලිය්යා සමාජය අධ්‍යාපනික හා සංස්කෘතික අගය කෙරෙහි උනන්දු කරවා අන්තර් ජාතික මට්ටමින් ප්‍රබල වූ ද වැදගත් වූ ද ප්‍රජාවක් බවට පත්කිරීමට පදනම කෙටියෙන් සහ ස්ථාවර ව ද ඉහත වැකි මගින් ඉදිරිපත් කර තිබෙන බව දැක ගත හැකි ය.

සමාජයක ප්‍රගතියට අධ්‍යාපනය වැදගත් ය. එම නිසා අනුවණකම යන අන්ධකාරයේ ගිලී සිටි ජාහිලියියා සමාජයේ දියුණුවට හේතු වන්නේ ය යන පදනමින් අල්ලාහු තආලා අධ්‍යාපනයේ වැදගත්කම ප්‍රථම වහීය මගින් අවධාරණය කර ඇත. එසේ ම මිනිසාගේ බිහිවීමට පසුපසින් ඇති සැබෑ තත්ත්වය ද කෙටියෙන් පහදා දී ඇත.

## අභ්‍යාසය

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. අල් කුර්ආනයේ ප්‍රථම වැකි පහ පහළ කරනු ලැබූ අවස්ථාව කෙටියෙන් පහදන්න.
2. මෙම වැකිය මගින් ඉදිරිපත් කෙරෙන වැදගත් අදහස් දෙකක් සඳහන් කරන්න.
3. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා හිරා ගුහාවට යෑම පුරුද්දක් කර ගැනීමට හේතු දෙකක් දක්වන්න.
4. අල්ලාහ්ගේ ගුණාංග දෙකක් සඳහන් කරන්න
5. පහත සිංහල පදවලට ගැළපෙන අරාබි වචන ලියන්න.

    1. රක්ෂිතයා
    2. මිනිසා
    3. පන්හිඳ
    4. ඉගැන්වූයේ ය

### ක්‍රියාකාරකම

සූරා අල් අලක් හි පළමු වැකි පහ එහි අර්ථය සමග වනපොත් කරන්න